ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක 2018 අගෝස්තු 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 ජූලි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ඉන්දු බණ්ඩාර මිය 2018 ජූලි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 3.4%ක් බව ප්‍රකාශ කලේය. පසුගිය ජූනි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2.5%ක් ලෙස වාර්තා විය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.09%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.31%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 ජූලි මාසයේ 6.3% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 3.7%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.6%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 ජූනි මාසයේ 126.5ක් වූ දර්ශකාංකය 2018 ජූලි මාසයේ 126.6ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 ජූලි මාසයේ දර්ශකාංකය 0.1ක වැඩිවීමක් එනම් 0.01ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.07%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.08%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා පොල්, සහල්, දෙහි, එළවළු, සීනි, රතුළූණු, සුදුළූණු, කඩල, මයිසූර් පරිප්පු සහ ගම්මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් අමු මිරිස්, අළුත් මාළු, බිත්තර, කරවල, පැපොල්, කෙසෙල්, කිරිපිටි, ලොකුළූණු, ළදරු කිරිපිටි, අර්තාපල්, අන්නාසි සහ අඹ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 ජූලි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන', 'විවිධ භාණ්ඩ හා සේවා', 'ආපනශාලා සහ හෝටල්', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'රෙදිපිළි හා පාවහන්', සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීමක් වාර්තා විය. මෙම කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා LP ගෑස් හා භූමිතෙල් මිල පහළ දැමීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'සන්නිවේදන' කාණ්ඩයේ සුළු වැඩිවීමක් වාර්තා විය. මෙම මස තුළ 'සෞඛ්‍ය', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවිය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |